# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 අප්‍රේල් මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2022.04.29 දින නිකුත් කරන ලදී)


# අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ (සංශෝධන)

**2017 අංක 5 දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 5 දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ නිසි අධිකරණයක් මඟින් කරනු ලබන ආඥාවක් මත පමණක්, අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක් බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක් බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීම සඳහා නඩුවක් ගොනු කරනු ලැබිය යුතු කාල සීමාව අවුරුදු තුනක් දක්වා අඩු කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ලිස්පෙන්ඩනයක් ලියාපදිංචි කිරීම සඳහා සවිස්තරාත්මක කාර්ය පටිපාටියක් නිශ්චිතව දැක්වීම වේ.

***5 වන වගන්තිය*** : පැහැදිලිව දැක්වීමේ කාර්යය සඳහා මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

# අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ (සංශෝධන)

එල්.ඩී.–ඕ. 48/2021

**2017 අංක 5 දරන** අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ **පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

*ලුහුඬු නාමය*

1. මේ පනත 2022 අංක    දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2017 අංක 5 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 5 දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

*"අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක් අවලංගු කිරීම*

2. අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක් බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීම, එම ඔප්පුවේ තෑගි දීමනාකරු විසින් තෑගි ලැබුම්කරුට එරෙහිව පවරනු ලබන නඩුවක දී, නිසි අධිකරණයක් විසින් කරනු ලබන ආඥාවක් මගින් පමණක් කරනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

*"නඩුව ගොනු කළ යුතු කාල සීමාව*

3. නඩු නිමිත්ත පැන නැගුනු දිනයේ සිට වසර තුනක කාලයක් ඇතුළත එම නඩුව ගොනු කරනු ලැබ ඇත්නම් මිස, 2 වන වගන්තියේ සඳහන් නඩුවක් අධිකරණය විසින් භාරගනු නොලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

"**ලිස්පෙන්ඩනයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය**

4. (1) මේ පනතේ විධිවිධාන යටතේ ගොනු කරන ලද නඩුවක පැමිණිලිකරු විසින්, පැමිණිල්ල සමඟ, ලිස්පෙන්ඩනය ලියාපදිංචි කිරීම සඳහා –

(අ) අවලංගු කිරීමට අපේක්ෂිත අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුව කලින් ලියාපදිංචි කරනු ලැබ ඇති, අවස්ථාවෝචිත පරිදි, අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා හෝ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා අමතන ලද; සහ

(ආ) අවලංගු කිරීමට අපේක්ෂිත අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුව කලින් ලියාපදිංචි කරනු ලැබ ඇති නිවැරදි පෙර ලියාපදිංචි කිරීමේ අංකය අන්තර්ගත කරන ලද,

ඉල්ලුම් පත්‍රයක් දිසා අධිකරණයේ ගොනු කිරීමට සැලැස්වීම හෝ ගොනු කිරීම කළ යුතු ය.

(2) අධිකරණය විසින්, ලිස්පෙන්ඩනයේ මුල් පිටපත, අනු පිටපත සහ පිටපතක් අදළ ඉඩමට සම්බන්ධ නිවැරදි වෙළුමේ සහ පත් ඉරුවේ ලියාපදිංචි කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා හෝ අදාළ හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට සැලැස්විය යුතු අතර ලිස්පෙන්ඩනයේ මුල් පිටපත දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත නැවත යැවිය යුතු ය.

(3) ලිස්පෙන්ඩනය අවස්ථාවෝචිත පරිදි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හෝ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නිවැරදි වෙළුමේ සහ පත් ඉරුවේ නිසි ලෙස ලියාපදිංචි කිරීමෙන් පසු පැමිණිලිකරු වෙනුවෙන් පෙනී සිටින ලේඛනගත නීතිඥවරයා විසින් –

(අ) අවස්ථාවෝචිත පරිදි, අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හෝ අදාළ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අදාළ සටහන් තමා විසින් නිසි පරිදි සහ පෞද්ගලිකව ම පරීක්ෂා කළ බවත්; සහ

(ආ) එම සටහන්වලට අනුව නඩුවේ පාර්ශ්වයක් ලෙස නඩුව පිළිබඳ දැන්වීම් ලබාදීමට වෙනත් කිසිම තැනැත්තකු ඇතුළත් නොවිය යුතු බවත්,

සඳහන් කරමින් ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය යුතු ය.

(4) දිසා අධිකරණය විසින්, එම ප්‍රකාශයේ ඇතුළත් කරුණු පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම්පත්‍රය "මුල් පිටපත", "අනු පිටපත" සහ "පිටපත" යනුවෙන් සලකුණු කොට පිටපත් තුනකින් යුක්තව (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ආකෘතියට සාරානුකූලව සකස් කළ යුතු අතර දිසා අධිකරණය විසින් ඒ නඩුවට ලබාදෙනු ලබන අංකය ඇතුළත් කිරීම සඳහා හිස් ඉඩක් එම ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් විය යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා” යන යෙදුමේ අර්ථ නිරූපණයේ “ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ; සහ” යන වචන වෙනුවට “ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;” යන වචන ආදේශ කිරීමෙන්;

(2) “ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:–

“ “හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා” යන්නෙන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත්කරනු ලැබුවා වූ ද, අවලංගු කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක විෂයගත ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික් බල සීමාව අයත් වූ ද හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ; සහ”.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව